සකස් කිරීම : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)

# නරි බැණා නාට්‍යයේ ගීත ගායනා කරමු. (දෙවන කොටස)

**පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.**

දයානන්ද ගුණවර්ධන ශූරීන්ගේ නිර්මාණයක්වන නරිබැණා නාට්‍යයේ එන නිර්දේශිත ගීත හා රිද්මයානුකූල වූ දෙබස් ඛණ්ඩ කිහිපයක් සඳහා රබන් පද මූලික කරගනිමින් නිර්මාණය කර ඇත. මෙහි එන කතා පුවත ගැමි කතා පුවතක් නිසා ජන නාද මාලා යොදාගෙන ඇති බව පෙනේ. නරිබැණා නාට්‍යයේ දෙබස් ගීතවත්ව ඉදිරිපත් කරන නිසා එය ශෛලිගත නාට්‍ය ලක්ෂණ පෙන්වයි.මෙහි සංගීත නිර්මාණය ආචාර්ය ලයනල් අල්ගම ශූරීන් විසිණි. එතුමා රබන් පද ආශ්‍රයකරගෙන සකසා ඇති ගීත මෙම නාට්‍ය තුළ අන්තර් ගතකර ඇත. තෙලෙන් බැද්දත් කොබෙයියා යන රබන් පදය ඇසුරු කරගනිමින් තෝච දෙන්නෙත් නරියටයි යන ගීතය ද බොලං පොඩි නංගි ටිකක් හිටපං යන රබන් පදය ට අනුව බලන් අපි උන්නෙ යන ගීතය හා ඉතින් සැනසෙන්න ගීතය නිර්මාණය කර ඇත.

## අභ්‍යාස

**හිස්තැන් පුරවන්න.**

1. ...................................ගීතය නරිබැණා නාට්‍යයේ ගම දූව විසින් ගායනා කරනු ලබන ඉතා සුමිහිරි ගීතයකි.
2. ................................... ගීතය බොලං පොඩි නංගි ටිකක් හිටපං යන රබන් පදය ඇසුරුකරගනිමින් නිර්මාණය කර ඇත.
3. තෝච දෙන්නෙත් නරියටයි යන ගීතය ............................................යන රබන් පදය ඇසුරෙන් නිර්මාණය කර ඇත.
4. නරි බැණා නාට්‍ය ...............................................................ශූරීන්ගේ නිර්මාණයකි.
5. නරි බැණ නාට්‍යයේ සංගීත නිර්මාණය ආචාර්ය .............................................. ශූරීන් විසින් නිර්මාණය කර ඇත.

(ඉතින් සැනසෙන්න/දයානන්ද ගුණවර්ධන/ඇහැළ මලින් ගස් පිරිලා/තෙලෙන් බැද්දත් කොබෙයියා/ලයනල් අල්ගම)